

# සිනුවර හසුන

**සිඩ්නි සිට ලියමි**

සිනුවර නම ඇසෙන විටම සිහියට නැගෙන සංකේත ත්‍රිත්වයක් ඇත. ඒවා නම්, ඔපෙරා මැදුර (Opera House), වරායේ පාලම (Harbour Bridge) සහ තුන් සොහොයුරියන් (Three Sisters) පිරිවරාගත් නිල් කඳුවැටිය (Blue Mountains) වේ.

මේවා සැබවින්ම විස්මිත නිර්මාණයෝ වෙතිය යන්න, සිනුවරුන් ගේ චිත්ත සනාතානයට පමණක් සීමා වූ ස්වයං වින්දනීය අදහසක් නොව, දේශ දේශාන්තරයෙන් මෙහි පැමිණි සංචාරකයින් ද නිරතුරු පවසන්නකි.

"කළු හිල සහ නරාවල" නම් වූ සිය කෙටිකතා එකතුවේ එන "පරතරය" නම් වූ නිර්මාණයේ දී ඕස්ට්‍රේලියානු සිංහල මහ ගත්කරු මෙල්බර්න් වාසී ඩී.බී. කුරුප්පු ද, මේ පිළිබඳ සැබෑ විවරණයක් කරයි. ඔහු ගේ මුද්‍රිත වචන උපුටා දක්වතොත් ඒ මෙසේ යඃ

(මෙල්බර්න් වල ඇති ලොකු ලොකු දේ ගැන සිතා) "ඔළුව තඩිස්සි කරගෙන ඔපෙරා හවුස් එක ගාවට ගිහින් සිඩ්නි වරායේ පාළම දිහා බලන කොට නම් තේරෙනවා අපේ යරා ගඟයි, අවට තියෙන කලා කේන්ද්‍රයි මොනවා ද කියලා"!

"කෝට් හැඟර්" හෙවත් කබා කොක්ක යන නමින් පොදු ජනයා හඳුන්වන සිනුවර වරාය පාළම ගොඩ නගා ඇත්තේ මීට වසර හැත්තෑ හයකට පෙර, එවකට ඩොලර් මිලියන දහයක වියදමිනි. එතෙක් දෙකඩ වී තිබුනු සිනුවර තදසන්න උතුරු-දකුණු ගම් පෙදෙස් මේ පාලමෙන් සඳකල් පවතින්නට එක් විණි. මේ අපූරු පාළමේ ඇති සුවිශේෂී වැදගත්කම නම් එය මාර්ග තීරු අටකින් යුතු මහා මාර්ගයක් ද, තීරු දෙකකින් යුතු දුම්රිය මාර්ගයක් ද, පයින් හෝ සයිකලයෙන් යන්නන් වෙනුවෙන් නිමවූ පටු මං දෙකක්ද සහිත අති සුවිශාල එකක් වීමයි. වසර හැත්තෑ පහකට පෙර, ජනගහනයෙන් ඉතා අඩු ප්‍රතිශතයකට පමණක් මෝටර් රථ තිබුනු, තවමත් අශ්වයින් පිට මිනිසුන් ගමන් ගත් යුගයක, මෙතරම් සුවිශාල මාර්ගයක් නිර්මාණය කරන්නට තරම්, එවකට සිටි පාලකයෝ දූරදර්ශී වීම සහ නිර්භීත වීම ඇදහිය නොහැකි තරම් ය.

ඔපෙරා මැදුර ඉදිකර ඇත්තේ මීට වසර තිස් පහකට ඉහත දී ඩොලර් මිලියන සියයක් තරම් වූ අධික වියදමක් දරමිනි. එය අද ප්‍රමුඛ ඕස්ට්‍රේලියානු සළකුණ ලෙස ලොවම පතලය. "අර බාගෙට ගිළුණු බෝට්ටු තියෙන්නේ සිඩ්නි වල නේද?" කියා ලංකාවේ කී දෙනෙක් නම් මගෙන් අසා ඇත්ද? ඔපෙරා මැදුර අද සිනුවර මුඛ්‍ය කලාගාරයයි. ඔපෙරා සහ වෙනත් නාටක පමණක් නොව, අග්‍ර ගණයේ ගීත සහ සංගීත සංදර්ශන ද එහි නිරතුරු පැවැත්වේ. සිනුවර කලා රසිකයෙකු වන කිත්සිරි කරුණාරත්න විසින් 2006 දී ඔපෙරා මැදුරේ සංවිධානය කරන ලද රෝහණ රන්සර ප්‍රසංගය මෙහිදී මා සිහියට නැගේ.

මිනිසුන් විසින් ගොඩ නගන ලද ඉහත කී සංකේත ද්විත්වය හා අසම සම වන තෙවන සිනුවර අරුමය නම් තුන් සොහොයුරියන් පිරිවරාගත් නිල් කඳුවැටිය යි. සිනුවර සිට බටහිර බලා දිවෙන මහා මාර්ගයේ කිලෝ මීටර සියයක් පමණ ගතවෙන හරියේ කටුම්බා උපනගරය ආශ්‍රිතව මෙම නිල් කඳු වැටි පෙල පිහිටා ඇත. කඳු මත සැදි මහ වනයේ පිරී ඉතිරී ඇති යුකැලිප්ටස් හෙවත් මැලියම් (gum) වෘක්ෂ වල වැදී හිරු එළිය පරාවර්තනය වන්නේ මනරම් නිල් පැහැයකින් වීම නිසා මේ නම ලද බව සාමාන්‍ය පිළිගැනීමයි.

නිල් කඳු පෙදෙසට යන දහස් ගණන් සංචාරක ජනතාව අනිවාර්යයෙන් ම නරඹන දර්ශනයක් නම් තුන් සොහොයුරියන් ය. මේ, එකිනෙක හා යා වී ඇති කුඩා ශෛලමය කඳු ගැටිති තුනකි. කටුම්බා පෙදෙසේ ස්වදේශික ජනප්‍රවාදයට අනුව මේ කඳු ගැටිති තුන වනාහී දුරාතීතයේ සිහින සමයේ දිනක මායාකරුවෙකු ගේ ඉන්ද්‍රජාල බලයෙන් ගල් වූ සොහොයුරියන් තිදෙනෙකි.

මිනිසුන් විසින් නිමවන ලද හෝ ස්වභාවික ඕනෑම දෙයක ඇති සුන්දරත්වය යනු නිසැකවම සාපේක්ෂ දෙයකි. ඔපෙරා මැදුර සහ වරාය පාලම හුදෙක් ගල් සහ යකඩ ගොඩවල් ලෙස යමෙකුට පෙනිය හැක. ඩොලර මිලියන ගණන් වටිනා පිකාසෝ ගේ චිත්‍රයක් විකෘති බලි රූපයක් ලෙස දකින අය ද නැතුවා නොවේ. මෙලෙසම, ස්වාභාවික සෞන්දර්‍යයේ අසිරිය ද, එය දකින ඇසෙන් ඇසට වෙනස් වේ.

මගේ සිහියට නැගෙන එක්තරා විනෝදාත්මක සිදුවීමක් ඔබට පවසමින් මෙවර සිනුවර හසුන අවසන් කරමි.

මෙහි කතා නායකයා, මීට වසර ගණනාවකට පෙර සංදර්ශනයක් සඳහා සිඩ්නි නුවරට පැමිණි විකට නළු ෆ්‍රෙඩී සිල්වා ය. ලංකාවේ සිට මෙහි පැමිණෙන කලාකරුවන් ට සිනුවර දසුන් පෙන්වීම සාමාන්‍යයෙන් කෙරෙන දෙයකි. මේ අනුව, ෆ්‍රෙඩී සිල්වා ව එක් දිනක් රැගෙන ගියේ මා පෙර විස්තර කළ, තුන් සොහොයුරියන් නැරඹීමට ය. පැය එක හමාරක පමණ ගමණකින් පසුව පිරිස කටුම්බා නගරයේ තුන් සොහොයුරියන් නැරඹුම් ස්ථානයට සම්ප්‍රාප්ත වූහ.

"අන්න තියෙනව ත්‍රී සිස්ටර්ස් ලා!" මාර්ගෝපදේශක සිනුවර වැසියෙකු ෆ්‍රෙඩී ට පැවසීය.

ෆ්‍රෙඩී සිල්වා තුන් සොහොයුරියන් දෙස හෙළුවේ එක් බැල්මක් පමණි.

"අයියෝ!!! මේ ගල් කෑලි කන්ද බලන්නද මෙච්චර දුරක් ආවේ"? ඔහු ක්‍ෂණිකව විමසීය.

එය විකට නළුවෙකු කළ ගොරහැඩි සරදමකට වඩා සැබෑ අපේක්ෂා භංගත්වයක් නිරූපනය කළ අවස්ථාවක් යැයි මම සිතමි. ශ්‍රී ලංකාවේ දී ස්වභාවික සෞන්දර්‍යයෙන් පිරි නොයෙකුත් මනරම් දර්ශන දැක ඇති ෆ්‍රෙඩී සිල්වා ට තුන් සොහොයුරියන් පෙනෙන්නට ඇත්තේ නව දැලි හේනක දැවුනු වැදිරියන් ලෙසිනි!

ලබන මාසයේ නැවත හමුවෙමු.

**සිනුවර ආරච්චිල**

<sinuwara.arachchila@gmail.com>



# සංක්‍රමණිකයකුගේ සටහන

## ඔබාමා

බරක් ඔබාමා ගේ ජනපති පදවි සම්ප්‍රාප්තිය කලු ජාතිකයකු ලොව බලවත්ම රාජ්‍යයේ නායකයා බවට පත්වීම හැරුන කොට ලෝක දේශපාලනයේ නව පිටුවක් පෙරළීමක් ලෙස අපට දැකිය හැක්කේ කුමන සාදක මත ද? කලු ජාතිකයකු නොව චීන හෝ මුස්ලිම් ජාතිකයකු එම තනතුරට පත් වුව ද ඇමරිකානු ලෝක දේශපාලන න්‍යාය පත්‍රය කිසි දිනෙක පුද්ගලයන් නිසා වෙනස් වන්නක් නොවේ. බොහෝ දෙනා ඇමරිකානු විදේශ ප්‍රතිපත්තියේ දැඩි වෙනස් කම් ඇති වේ යයි සිහින දකිමින් සිටිති. මිනිසුන් කොහොමත් කැමති තමන්ගේ ඇහැට පෙනෙන දුර ගැන හිතන්නට පමණකි.

බරක් ඔබාමා යනු ඇමරිකානු දේශපාලනය ඉදිරියට ගෙන යන යාන්ත්‍රනයේ ප්‍රධාන සුක්කානම හසුරුවන්නායි. ඔහුට යන මග කියා දෙන්නට අප නොදන්නා තව බොහෝ අය සිටිති. වෙනසකට ඇත්තේ නායකයාගේ පැහැය පමනය ඔබාමා විසින් තමා-ගේ ඉදිරි කටයුතු ගෙන යාම සඳහා පත් කරනු ලැබ ඇති කන්ඩායම දෙස බැලූ විට වටහා ගත හැක්කේ ඇමරිකානු මැදිහත්වීම සෘජුවම ඇති පලස්තීන ගැටලුව ඉරාක අර්බුදය ඇෆ්ඝනිස්තාන් ප්‍රශ්නය සම්බන්ධයෙන් කිසිදු තීරනාත්මක වෙනසක් සිදුනොවන වගයි.

අප සිතන පරිදි කටයුතු සිදුවන්නේ තුන්වන ලෝකයේ රාජ්‍යයන්හි පමණ ය. එහි නායකයන්ට කැමති දෙයක් වෙනස් කරන්නට හැකිය. මන්ද ගන්නා තීරණ වලට වගකිවයුත්තෙක් නැති නිසාය. ඇමරිකානු ක්‍රමය තුල එවැනි ඉඩක් නැත. පිටවන වචනයකට වුවද පිටකරන්නාට වගකීමක් ඇති ලෙස ය එහි ක්‍රමය සැදී ඇත්තේ ය.

කෙසේ වුව ද ඔබාමා ධවල මන්දිරයට ඒවි. එලෙසම ආපසු යාවි. අවසානයේ කලු මිනිසෙක් ලොව බලවත්ම රාජ්‍යයේ නායකයා බවට පත්වීම ඉතිහාස ගත වීමත් කෙන්යාවේ ඈත පිටිසර ඔබාමාගේ ආච්චි අම්මාගේ ගෙදරට එරට රජයෙන් නොමිලයේම විදුලිය ලබාදීමත් ඇර සියල්ල පෙර ලෙසම ඉදිරියට යනු ඇත.

## භාරතයයි අපයි

ඉන්දියාවේ පසුගියදා ඇති වුණ ත්‍රස්තවාදී ක්‍රියාදාමයත් සමග එරට අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධ වගකිවයුත්තන් තමන්ගේ වගකීම බාර ගනිමින් තමන් දැරූ තනතුරු වලින් ඉල්ලා අස්වීම රටට හෙන ගැසුවත් ඉන්නා තැනින් ඇදලා දැම්මත් නොසෙල්වී සිටින අපේ ගොයියන්ට හොඳ ආදර්ශයක්. මීට කලිනුත් ඉන්දියාවේ දුම්රිය අනතුරක් සම්බන්ධයෙන් වගකීම බාර ගනිමින් අදාල ඇමති වරයා ඉල්ලා අස් වුන හැටි අපට මතකයි. ඉතා පහසුවෙන් ඒ වගකීමෙන් ගැලවෙන්න අවස්ථාව තිබ්ලත් එසේ නොකිරීමෙන් ඒ මිනිස්සු රටට ලෝකයට දෙන්නෙ ශ්‍රෙෂ්ට ආදර්ශයක්.

සින්දුයි චිත්‍රපටයි ඇරුනම ඉන්දියාවෙන් අපට ගත හැකි දේ නම් අපමනයි. තමන්ගේ හෘද සාක්ෂියට එකඟව වැඩ කිරීම ඉන් ප්‍රධානයි. කරුමෙට ඉන්දියාවෙන් විතරක් නොවෙයි ලෝකේ කොයි කොදෙව්වෙනුත් අපි හැම විටම උකහා ගන්නේ නරුම චාරිත්‍රම තමයි. ඉල්ලා අස්විම කියන එක අපට විහිලුවක්. ඉල්ලා අස් වෙන්න නෙවෙයි බෙල්ලේ වැල දාගන්න සයිස් එකේ වැඩ කීයක් නම් වුනාද පහුගිය දවස් වල ආරක්ෂාව සම්බන්ධයෙන්. වගකිව යුත්තන් එකෙක් "හ්ම්" කිව්ව ද? ඉන්දියන් කාරයෝ එහෙම කරාට අපේ කට්ටිය කලොත් රට ජාතිය බේරාගන්නේ ඇමරිකාවෙන් ගෙනල්ලද කියලා තමයි කට්ටිය හිතනවා ඇත්තෙ .

## මානව හිමිකම් දිනය - දෙසැම්බර් 10

ජාත්‍යන්තර මානව හිමිකම් දිනය දෙසැම්බර් 10 වන දාට යෙදී තිබෙනවා. හිමිකම් සිහිකිරීමට දිනයක් සෑහුනත් ජනතාවගේ අයිතීන් සුරැකීමට දිනයකින් කල හැක්කේ කුමක් ද? ඒ දිනයත් අනිත් දින මෙන්ම ගෙවී යනු ඇති. මානව හිමිකම් කඩ කිරීම වලට විරුද්ධ සංවිධානත් ස්වෙච්ඡා ආයතනත් තමන්ගේ ප්‍රතිරූප හා පැවැත්ම උදෙසා යම් ක්‍රියාකාරකම් වල යෙදෙනු ඇත . අපේ රටේ මානව හිමිකම් දිනවල සැබෑ තත්වය එයයි. කුඩා දරුවාගේ පටන් වයසක මහල්ලා දක්වා ලිංග බේදයක් ජාති බේදයක් පලාත් බේදයක් නොමැතිව රට තුල මානව හිමිකම් කඩකිරීම් උත්සන් වෙමින් පවතියි. සමාන පුරවැසියන් ලෙස ජීවත් වීමේ මූලික අයිතියද බොහෝ දෙනෙකුට අහිමි වී තිබේ. මේ තත්වයට වගකිවයුතු පුද්ගලයන්ද සමාජ සංවිධාන ද අමාත්‍යාංශද රජයද නිසි වැඩ පිලිවෙලක් හෝ නොමැතිව අඳුරේ අතපත ගාමින් සිටිති. මූලිකව ජනතාවගේ මානව හිමිකම් සුරැකීමට නම් ඔවුනට ඒ පිළිබඳව නිසි දැනුමක් ලබා දිය යුතු ය. නීති රීති හෝ ප්‍රඥප්ති මගින් හෝ මානව අයිතිවාසිකම් සුරැකීමට යාම විහිලුවකි. එසේ කල හැකි නම් එය සිදුවී බොහෝ කල් ය. රටක පුරවැසියාගේ මානව හිමිකම් සුරැකීමේ වගකීමෙන් ගැලවීමට කිසිදු රජයකට ඉඩක් නැත්තේ මානව හිමිකම් සුරැකීම රජයක ප්‍රධාන වගකීමක් වන නිසා ය. එහෙත් වැටත් නියරත් ගොයම් කා නම් ..... කුමන කතා ද?

වසර හතරකුත් ගෙවී ගිහින්. දැන් ඒ ඛේදවාචකය වසරකට වරක් කෙරෙන ස්මරනයක් පමනක් වීම කොයි තරම් අභාග්‍යයක් ද? ඒම හා විනාශයෙන් මියගිය හා අනාථ භාවයට පත් වුන මිනිසුන් ගැනත් ඒ නිසාම තවමත් අනාත කඳවුරු වල ගාල් වී සිටින මිනිසුන් ගැනත් මොහොතකට අමතක කරමු. අඩුම තරමින් තවත් එවැනි ව්‍යසනයක් සඳහා පූර්ව සූදානමක් අපේ රටේ ගොඩ නැගී තිබෙනවා ද? එවැනි තත්වයකදී ක්‍රියාත්මක කල හැකි ජනතා_ආරක්ෂක සහන සේවා වැඩ පිලිවෙලක් වත් සංවිධානය වී තිබෙනවා ද? සුනාමි අනුස්මරනය කරන මොහොතක අපි කතා කල යුත්තේ එයයි. එම අනතුරින් විපතට පත් සියලුම රටවල් ඒ වෙනුවෙන් ආනාගත ආරක්ෂනවාදී වැඩ සටහන් සංවිදානය කර ඇතත් අප ඒ වෙනුවෙන් කර ඇත්තේ කුමක් ද.?

අනතුරු කල් තබා දැනගත හැකි උපකරන සවිකිරීම පිලිබඳ ඝෝෂාවක් ඒ දිනවල පැවතුනත් ඒවා ඉතා කෙටි කලකින් අමතක වීම අපේ ජන්ම ගති ලක්ෂනයක් නොවේ ද? සුනාමිය සමරන මේ මොහොතේ දී මියගිය අතුරුදහන් හා අනාථ වූ දහස් ගනනක් වෙනුවෙන් කල හැකි හොඳ ස්මරනය නම් මතු එවැනි විපතක් වලක්වා ගැනීමේ වැඩ පිලිවෙලක් සකසා ගැනීම සඳහා අවදියෙන් සිටීම ය. වගකියුත්තන්ගේ ඇස් ඇරේවා.

## සුබ නව වසරක්

අලුත් අවුරුද්දක් එලැඹෙන විට සුබ පැතීම සම්ප්‍රදායක්. එවන් සුබ පැතුමකින් කෙරෙන්නෙ එලැඹෙන වසර සඳහා අලුත් ආකල්ප බලාපොරොත්තු එක් කර ගනිමින් පෙර සූදානම් වීමකට පෙලඹවීමක්. ඒ නිසාම වසරක් පුරා සංක්‍රමනිකයා සමග අත්වැල් බැඳගත් දහස් ගනනක් වන පාඨක ඔබ සැමට සුබ නව වසරක් වේවා කියලා මේ ආසිරි සංක්‍රමනිකයාගෙන්.

සංක්‍රමණිකයා